විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මැලිගාවත්ත ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2011   දිනය / திகதி / Date 2011-03-23

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 7/2010 (සංශෝධන 1)**

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා, වාරික වශයෙන් අයකිරීමේ පදනම මත**
**<u>දඹදිව වන්දනාව සඳහා ගුවන් ටිකට්පත් ලබාදීම. - *මිහින් ලංකා ගුවන් සමාගම.*</u>**

මවිසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 7/ 2010 සංශෝධනය කරමින් මෙම උපදෙස් නිකුත් කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා මෙන්ම විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහාද දඹදිව වන්දනාව සඳහා වාරික වශයෙන් ගෙවීමේ පදනම මත ගුවන් ටිකට්පත් ලබාදීමට ***මිහින් ලංකා සමාගම*** තීරණය කොට තිබේ.

ඒ අනුව විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියනට මෙම සහනය ලබාදීම සම්බන්ධව පහත සඳහන් පරිදි ක්‍රියාකළ හැකි බව කාරුණිකව දන්වමි.

1 කිසියම් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියකු විසින් ***මිහින් ලංකා*** ගුවන් යානයකින් දඹදිව වන්දනාවේ යාමේ ඉල්ලීමක් මිහින් ලංකා සමාගම මගින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම. (අදාළ ආකෘතිපත්‍රය භාවිතා කර,)

2 එම ඉල්ලීම අනුව අධ්‍යක්ෂ ජනරාල්ගේ සහතිකය නිකුත් කිරීම හා ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම්දීම.

3 ටිකට්පත ලබාගැනීමට අවශ්‍ය මුල් වාරිකය චෙක්පතකින් ***මිහින් ලංකා සමාගම*** වෙත ඉදිරිපත් කිරීම.

4 ඉතිරි මුදල සමාන වාරික 09 කින් අයකොට මාසිකව ***මිහින් ලංකා සමාගම*** වෙත ප්‍රේෂණය කිරීම.

5 වාරික ගෙවා නිමවන තෙක් විශ්‍රාම වැටුප් ගෙවීම වෙනත් කාර්යාලයකට මාරු නොකළ යුතුය. එමෙන්ම අයදුම්පත, ගිවිසුම්පත හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ සහතික පිටපත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තබාගත යුතුය.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov.lk |

1 වාරික වටිනාකම සඳහා රක්ෂාවරණක් පවතින බැවින් කිසියම් අවස්ථාවකදී විශ්‍රාමිකයා මියගිය හොත් වාරික අයකිරීම නවතා දැමිය යුතුය.

2 මෙම විධිවිධාන විශ්‍රාම වැටුප්ලාභීන් සහ වැන්දඹු විශ්‍රාම වැටුප්ලාභීන්ට සීමාවේ.

3 ***මිහින් ලංකා සමාගම*** කළමණාකාරීත්වය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් අවශ්‍ය ආකෘතිපත්‍ර ඔබ වෙත සැපයීමට කටයුතු කෙරේ.

වාරික මුදල් අයකිරීම පිළිබඳව ආදර්ශය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| උදා: | ටිකට්පතක අලවි මිල | රු. 33,450.00 |
| | දෙරටේ ගුවන්තොටුපල බදු | රු. 2,200.00 |
| | | 35,650.00 |

| | |
|---|---|
| වාරිකයකට ගෙවිය යුතු මුදල | රු. 3345.00 |
| මුල් වාරිකය සමග ගුවන් තොටුපල බද්ද | රු. 2200.00 |

අවශ්‍ය වන්නේ නම් වැඩිදුර තොරතුරු සඳහා පහත ලිපිනයෙන් හා දුරකථන අංකයන්ගෙන් විමසීම් කළ හැකිය.

කළමනාකරු, රාජ්‍ය හා පොදු කටයුතු,
සී/ස, මිහින් ලංකා සමාගම,
අංක 61, WAD රාමනායක මාවත,
කොළඹ 02.
දුරකථන අංක: 077- 3945044, 011- 7800354-5

කේ.ජී. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත්: 1. ප්‍රධාන විධායක නිලධාරි, මිහින් ලංකා සමාගම.
2. විශ්‍රාමික සංගම් නිලධාරීන්
3. විගණකාධිපති

| මිහින් විවැදෙ/ සං. 1 | |
|---|---|

## සී/ස මිහින් ලංකා ගුවන් ගමන් අයදුම්පත

## විශ්‍රාමිකයන් සඳහා

| විශ්‍රාම වැටුප් අංකය: |
|---|
| ප්‍රා.ලේ. කොට්ඨාශය: |

කළමනාකරු,
සී/ස මිහින් ලංකා මගින්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත.

විශ්‍රාම වැටුප් හිමියාගේ නම : ..............................................................................

පෞද්ගලික ලිපිනය : ..............................................................................

..............................................................................

..............................................................................

දුරකථන අංකය : ..............................................................................

**ගමන් කිරීමට අපේක්ෂිත ගමනාන්ත**

බුද්ධගයා ☐ බරණැස ☐ ට්‍රිචි ☐ කාල සීමාව ..............................

වි.වැ. චක්‍රලේඛ 7/ 2010 (සංශෝධන - 1) අනුව මගේ වැටුපෙන් මාසික වාරික 10 කින් සම්පූර්ණවන සේ මාසිකව හරකොට මිහින් ලංකා වෙත ගෙවා ඉහත පරිදි ගුවන් ටිකට්පත ලබාදෙන මෙන් ඉල්ලමි. මුල්වාරිකය සමඟ ගුවන් තොටුපල බදු අය කළ මැනවි.

.............................................

දිනය: විශ්‍රාමිකයාගේ අත්සන

ඉහත විස්තර සඳහන් ................................................................මහතාගේ/ මහත්මියගේ අත්සන බව සහතික කරමි.

.............................................

අත්සන

ග්‍රාම නිලධාරීගේ නම : ..............................................

වසම : ..............................................

නිල මුද්‍රාව : ..............................................

---

අයදුම්පත සම්පූර්ණකොට
මෙම ලිපිනයට එවන්න →

කළමනාකරු
රාජ්‍ය හා පොදු කටයුතු
සී/ස මිහින් ලංකා
61, ඩබ්.ඒ.ඩී. රාමනායක මාවත,
කොළඹ 2.